දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 / 2784807 / 2785617
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 / Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය / உமது இல. / Your No. } ......................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்லை.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/4/58/1

දිනය / திகதி / Date } 2014.01.31

පළාත් අධ්‍යාපන ලේකම්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ

**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ ස්ථාන මාරු - 2014</u>**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ඉදිරි සීමිත/විවෘත බඳවා ගැනීම්වලට සමගාමීව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ අත්‍යවශ්‍යයෙන්ම ස්ථාන මාරු අවශ්‍යතා තිබෙන නිලධාරීන්ගේ ඉල්ලීම් පමණක් සළකා බැලීමට තීරණය කර ඇත.

ඒ අනුව, මේ සමග එවනු ලබන ඇමුණුම 01 හි සඳහන් ජාතික පාසල් නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු සඳහා (සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ නිලධාරීන්ට පමණක් ඉල්ලුම් කළ හැක) හෝ වෙනත් විශේෂ අවශ්‍යතා මත දැනට සිටින සේවා ස්ථානයෙන් වෙනත් සේවා ස්ථානවලට ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන නිලධාරීන් 2014.02.28 දින වන විට පහත ලිපිනයට ලැබෙන සේ ඇමුණුම 02 ආකෘතියට අනුව ස්ථාන මාරු ඉල්ලුම්පත් යොමු කළ යුතු අතර ඒ බව සියළුම නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි. (කවරයේ ඉහළ වම් කෙලවර "ශ්‍රී ලං. අ. ප. සේ. III පන්තියේ ස්ථාන මාරු - 2014" ලෙස සටහන් කළ යුතුය)

> සහකාර ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
> අධ්‍යාපන අමාත්‍යාංශය, "ඉසුරුපාය"
> පැලවත්ත, බත්තරමුල්ල

මෙහිදී දැනට ජාතික පාසල්වල සේවය කරන නිලධාරීන් අදාල විදුහල්පතිගේ නිර්දේශ සහිතවද පළාත්වල සේවය කරන නිලධාරීන් පළාත් බලධාරීන්ගේ නිර්දේශ සහිතවද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

මෙම ස්ථාන මාරු ඉල්ලුම් කරන නිලධාරීන්ගේ ඉල්ලීම් සළකා බලා අත්‍යවශ්‍ය ඉල්ලීම් සඳහා ඉදිරි සීමිත/විවෘත බඳවා ගැනීම්වලදී අනුප්‍රාප්තිකයන් ලබාදී ස්ථාන මාරු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. (පාඨමාලාවන් හැදෑරීම, දෙමව්පියන්ගේ රෝගී තත්ත්වයන් වැනි කරුණු ස්ථාන මාරුවක් ලබා දීමට හේතුවක් සේ නොසලකනු ඇත)

එබැවින් ඔබ වෙත අදාල අනුප්‍රාප්තිකයන් නම් කර ස්ථාන මාරු නියෝග එවනු ලැබූ විට ඒ අනුව ඔබ පළාතට/ජාතික පාසලට අයත් නිලධාරීන් විධිමත් ලෙස නිදහස් කළ යුතු බව කාරුණිකව දන්වමි.

තවද 2014.02.28 දිනට පසු අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබෙන ස්ථාන මාරු අයදුම්පත් පිළිබඳව සළකා බලනු නොලබන අතර මීට පෙර විවිධ අවස්ථාවල අභියාචනා ඉදිරිපත් කොට ඇති නිලධාරීන්ද මෙම උපදෙස් පරිදි ඉල්ලුම් කිරීම අත්‍යවශ්‍ය බවද අවධාරණය කරමි.

කෙසේ වුවද ස්ථාන මාරු අයදුම්පතක් ඉදිරිපත් කිරීම ස්ථාන මාරු ලබා ගැනීමට හිමිකමක් නොවන බවද සඳහන් කරමි.

උපාලි මාරසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

ඇමුණුම 01

# ජාතික පාසල් නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු තොරතුරු

## මධ්‍යම පළාත

| අංකය | පාසල | නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව | මාධ්‍ය |
|---|---|---|---|
| 1. | මහ/පූජාපිටිය මධ්‍ය මහා විද්‍යාලය | 01 | සිංහල |
| 2. | මා/සංඝමිත්තා බාලිකා විද්‍යාලය, මාතලේ | 01 | සිංහල |
| 3. | මහ/බෝපිටිය රාජසිංහ ජාතික පාසල | 01 | සිංහල |
| 4. | මහ/කිංස්වුඩ් විද්‍යාලය | 02 | සිංහල |
| 5. | මහ/ශ්‍රී රාහුල විද්‍යාලය, කටුගස්තොට | 01 | සිංහල |

## වයඹ පළාත

| අංකය | පාසල | නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව | මාධ්‍ය |
|---|---|---|---|
| 1. | කු/කුලියාපිටිය ම.ම.වි | 01 | සිංහල |
| 2. | කු/නාරම්මල මයුරපාද ම.ම.වි. | 01 | සිංහල |
| 3. | කු/වාරියපොල ශ්‍රී සුමංගල ජාතික පාසල | 01 | සිංහල |
| 4. | කු/මාවතගම ම.ම.වි. | 01 | සිංහල |
| 5. | කු/නක්කාවත්ත ජාතික පාසල | 01 | සිංහල |
| 6. | කු/අලව්ව ශ්‍රී රාහුල ජාතික පාසල | 01 | සිංහල |
| 7. | කු/ගිරිඋල්ල වික්‍රමශීලා විද්‍යාලය | 01 | සිංහල |
| 8. | කුළි/පඬුවස්නුවර එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරණායක ම.වි. | 01 | සිංහල |
| 9. | කු/පැරකුම්පුර ජාතික පාසල | 01 | සිංහල |
| 10. | හලා/ ධම්මිස්සර ම.ම.වි., නාත්තණ්ඩිය | 01 | සිංහල |
| 11. | හලා/ආනන්ද ජාතික පාසල | 01 | සිංහල |

## බස්නාහිර පළාත

| අංකය | පාසල | නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව | මාධ්‍ය |
|---|---|---|---|
| 1. | කො/තර්ස්ටන් විද්‍යාලය | 01 | සිංහල |
| 2. | කො/ප්‍රෙස්බිටිරියන් බා.වි, දෙහිවල | 01 | සිංහල |
| 3. | කො/රාජකීය විද්‍යාලය | 02 | සිංහල |
| 4. | වේල්ස් කුමර විද්‍යාලය, මොරටුව | 01 | සිංහල |
| 5. | කො/හින්දු විද්‍යාලය, බම්බලපිටිය | 01 | සිංහල |
| 6. | කො/ශ්‍රී සුභූති ජාතික පාසල, බත්තරමුල්ල | 01 | සිංහල |
| 7. | කො/බෝමිරිය ජාතික පාසල | 01 | සිංහල |
| 8. | කො/පිළියන්දල ම.ම.වි. | 01 | සිංහල |
| 9. | ආනන්ද විද්‍යාලය කොළඹ | 01 | සිංහල |
| 10. | ඉසිපතන විද්‍යාලය කොළඹ | 02 | සිංහල |
| 11. | මීග/හරිස්චන්ද්‍ර විද්‍යාලය | 02 | සිංහල |
| 12. | මීග/නිව්ස්ටඩ් බාලිකා විද්‍යාලය | 01 | සිංහල |
| 13. | කළු/ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය, පානදුර | 02 | සිංහල |
| 14. | කළු/ඩී.එස්.සේනානායක විද්‍යාලය, බේරුවල | 01 | සිංහල |
| 15. | හොරණ රාජකීය විද්‍යාලය | 02 | සිංහල |
| 16. | ශාන්ත ජෝන් විද්‍යාලය, පානදුර | 01 | සිංහල |
| 17. | කළුතර බාලිකා විද්‍යාලය | 02 | සිංහල |

සබරගමු පළාත

| අංකය | පාසල | නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව | මාධ්‍ය |
|---|---|---|---|
| 1. | කෑ/ශාන්ත මරියා ම.වි. | 01 | සිංහල |
| 2. | කෑ/දෙහිඕවිට ජාතික පාසල | 01 | සිංහල |
| 3. | කෑ/කෑගලු විද්‍යාලය | 01 | සිංහල |
| 4. | කෑ/පින්නවල ජාතික පාසල | 01 | සිංහල |
| 5. | ර/ෆර්ගසන් උසස් විද්‍යාලය | 01 | සිංහල |
| 6. | ර/ඇහැලියගොඩ ම.ම.වි. | 01 | සිංහල |
| 7. | කෑ/රාජසිංහ ම.ම.වි. | 02 | සිංහල |
| 8. | කෑ/තෝලංගමුව ඩඩ්ලි සේනානායක ම.ම.වි. | 01 | සිංහල |
| 9. | ර/සුමන බාලිකා විද්‍යාලය | 01 | සිංහල |

ඌව පළාත

| අංකය | පාසල | නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව | මාධ්‍ය |
|---|---|---|---|
| 1. | බ/පස්සර දෙමළ මධ්‍ය මහා විද්‍යාලය | 01 | දෙමළ |
| 2. | බ/මහියංගනය ජාතික පාසල | 01 | සිංහල |
| 3. | මො/කතරගම ජනාධිපති ම.ම.වි. | 01 | සිංහල |

දකුණු පළාත

| අංකය | පාසල | නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව | මාධ්‍ය |
|---|---|---|---|
| 1. | ගා/මහින්ද විද්‍යාලය | 01 | සිංහල |
| 2. | ගා/ධර්මාශෝක විද්‍යාලය | 01 | සිංහල |
| 3. | ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය, අම්බලන්ගොඩ | 01 | සිංහල |
| 4. | ගා/ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලය, බද්දේගම | 01 | සිංහල |
| 5. | ගා/රේවත ජාතික පාසල, බලපිටිය | 01 | සිංහල |
| 6. | ගා/විද්‍යාරාජ ජාතික පාසල, තවලම | 01 | සිංහල |
| 7. | මාර/ශ්‍රී සුමංගල බා.වි., වැලිගම | 01 | සිංහල |
| 8. | ගා/මානවිල උපනන්ද විද්‍යාලය | 01 | සිංහල |
| 9. | මාර/මින්හාත් ජාතික පාසල, දික්වැල්ල | 01 | දෙමළ |
| 10. | මාර/දෙයියන්දර ජාතික පාසල | 01 | සිංහල |
| 11. | හ/තංගල්ල බාලිකා විද්‍යාලය | 01 | සිංහල |
| 12. | හ/රාජපක්ෂ ම.ම.විද්‍යාලය, වීරකැටිය | 01 | සිංහල |
| 13. | මාර/රාහුල විද්‍යාලය | 01 | සිංහල |

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ ස්ථාන මාරු අයදුම්පත්‍රය - 2014

1. (i) සම්පූර්ණ නම : ______________________

______________________ හිමි/මයා/මිය/මෙය

(ii) මුලකුරු සමග නම : ______________________

(iii) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

2. දැනට සේවය කරන පාසලේ/ කාර්යාලයේ නම, ලිපිනය හා කලාපය (i) ______________________ කාර්යාලය

(ii) ______________________ කලාපය (අදාල නම්)

(iii) කාර්යාලීය දුරකථන අංකය ______________________

පෞද්ගලික දුරකථන අංකය ______________________

3. ස්ථිර පෞද්ගලික ලිපිනය : ______________________

4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ______________________

5. ස්ත්‍රී පුරුෂ භාවය (අදාල අංකය ඉදිරිපස කොටුවේ ලියන්න) [ ]
1. පුරුෂ 2. ස්ත්‍රී

6. විවාහක අවිවාහක භාවය (අදාල අංකය ඉදිරිපස කොටුවේ ලියන්න) [ ]
1. විවාහක 2. අවිවාහක

7. (i) උපන් දිනය : අවුරුද්ද [ | | | ] මාසය [ | ] දිනය [ | ]

(ii) වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

8. (i) මුල් පත්වීම් දිනය : ______________________

(ii) පත්වීමේ ස්වභාවය :
- විවෘත/සීමිත/ජ්‍යෙෂ්ඨතා/කුසලතා ______________________
- සාමාන්‍ය සේවක සංඛ්‍යාව [ ]
  විශේෂ සේවක සංඛ්‍යාව [ ]
- විෂයය - (විශේෂ සේවක සංඛ්‍යාවේ නම්) ______________________

9. දැනට සේවය කරනු ලබන ස්ථානයේ රාජකාරි භාර ගත් දිනය :
අවුරුද්ද [ | | | ] මාසය [ | ] දිනය [ | ]

10. ශ්‍රී ලං.අ.ප.සේ. ශ්‍රේණිය : ______________________

11. ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරන ලබන පළාත්/පාසල් :

| | |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |

12. මුල් පත්වීමේ සිට ඉල්ලුම්පත ඉදිරිපත් කරන දින දක්වා අඛණ්ඩ සේවා විස්තර දක්වන්න. (ඉඩ කඩ ප්‍රමාණවත් නොවේ නම් වෙනම අමුණන්න)

| අනු අංකය | සේවය කළ ස්ථානයේ/අනුයුක්තව සිටි ස්ථානයේ/ අධ්‍යයන නිවාඩු ලබා ඉගෙන ගත් ස්ථානයේ නම හා ලිපිනය | සේවා කාලය | | |
|---|---|---|---|---|
| | | අවුරුදු | මාස | දින |
| 01 | | | | |
| 02 | | | | |
| 03 | | | | |
| 04 | | | | |
| 05 | | | | |
| මුළු සේවා කාලය | | | | |

13. ස්ථාන මාරුව ඉල්ලුම් කිරීමට හේතුව :
(ඔබේ ඉල්ලීම තහවුරු කෙරෙන ලිපිවල පිටපත් උදා- වෛද්‍ය සහතික/විවාහ සහතික තිබේ නම් අමුණන්න)

______________________________
______________________________
______________________________

14. විවාහක නම්,
(i) ස්වාමිපුරුෂයාගේ/භාර්යාවගේ නම : ______________________________

(ii) තනතුර : ______________________________

(iii) සේවා ස්ථානයේ ලිපිනය : ______________________________
______________________________

15. දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|
| | | |
| | | |
| | | |

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවත් මා හට විරුද්ධව විනය පරීක්ෂණයක් නොමැති බවත් මෙයින් ප්‍රකාශ කරමි. අසත්‍ය තොරතුරු සඳහන් කිරීම විනයානුකූලව දඬුවම් ලැබිය හැකි වරදක් බව දනිමි.

දිනය - ______________

______________
ඉල්ලුම්කරුගේ අත්සන

**කලාප අධ්‍යක්ෂගේ/ජාතික පාසලේ විදුහල්පතිගේ නිර්දේශය**

ඉහත නම සඳහන් නිලධාරියා/නිලධාරිනියගේ ස්ථාන මාරු අයදුම්පත මෙයින් ඉදිරිපත් කරමි. මෙම නිලධාරියා අනුප්‍රාප්තිකයකු සහිතව/රහිතව නිදහස් කරමි.

මෙම නිලධාරියාට විරුද්ධව විනය, විගණන පරීක්ෂණයක් නොතිබූ බවත්, දැනට නොපැවැත්වෙන බවත් ප්‍රකාශ කරමි.

දිනය - ______________      ______________

(අත්සන හා නිල මුද්‍රාව)

කලාප අධ්‍යක්ෂගේ/විදුහල්පතිගේ නම : ______________________________

සේවය : ______________________________

---

**පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය (පළාත් නිලධාරීන් සඳහා)**

ඉහත නම සඳහන් නිලධාරියා/නිලධාරිනියගේ ස්ථාන මාරු අයදුම්පත අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය - ______________      ______________

(අත්සන හා නිල මුද්‍රාව)

---

**පළාත් අධ්‍යාපන ලේකම්ගේ නිර්දේශය (පළාත් නිලධාරීන් සඳහා)**

ඉහත නම සඳහන් නිලධාරියාගේ/නිලධාරිනියගේ ස්ථාන මාරු අයදුම්පත අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය - ______________      ______________

(අත්සන හා නිල මුද්‍රාව)

---

සැ.යු. **2014.02.28 දිනට පසුව සහකාර ලේකම් අධ්‍යාපන සේවා ආයතන වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**